# 7. දැසේ නිල් පැහැය

**ශ්‍රේණිය** : 9

**වාරය** : 11

**නිපුණතා මට්ටම්** : **11.2** **සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙවේ.**

**5.1** **වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.**

**12.1** **පද්‍ය රචනා නිර්මාණය කරයි.**

## ක්‍රියාකාරකම්

**පාඩම හොඳින් කියවන්න. අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**1. පහත දැක්වෙන වාක්‍ය නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද ඉදිරියේ ඇති වරහන මත යොදන්න.**

i. කවිය යනු මිනිසාගේ ජීවිතාවබෝධය පුළුල් කරන සාහිත්‍යාංගයකි. ( )

ii. කවියාගේ මෙවලම භාෂාවයි. ( )

iii. කවි නිර්මාණය කිරීමට සහජයෙන් ලද හැකියාව පමණක් ප්‍රමාණවත් වේ. ( )

iv. පොත්පත් පරිශීලනයෙන් ලබන අවබෝධය, නිරන්තර අභ්‍යාසය කවි නිර්මාණය හා රස විඳීමට අවශ්‍ය වේ. ( )

v. විවිධ කාව්‍ය නිර්මාණ රස විඳීමෙන් අපගේ ජීවිතාවබෝධය පුළුල් වේ. ( )

vi. දැසේ නිල් පැහැය පද්‍ය පන්තිය දයාසේන ගුණසිංහ කවියාගේ නිර්මාණයකි. ( )

vii. එය උපුටා ගන්නේ ‘‘රන් තැටියක කඳුළු’’ කාව්‍ය සංග්‍රහයෙනි. ( )

viii. එය 1964 රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලැබූ කෘතියකි. ( )

**2. පහත පදවල අර්ථය දී ඇති පද අතුරෙන් තෝරන්න. ලියන්න.**

i. සහජයෙන් - ..........................................

ii. පරිශීලනය - ..........................................

iii. දෙව් - ..........................................

iv. ඉඳුවර - ..........................................

v. උවම් - ..........................................

vi. අවරින් - ..........................................

vii. දියඹ - ..........................................

| |
|---|
| භාවිතය |
| නිල් මානෙල් |
| උපමා |
| උපතින් |
| බටහිරින් |
| ගැඹුරු මුහුද |
| දිව්‍ය |
| නෙළුම් |

**3. පද්‍ය පන්තිය හොඳින් කියවා, පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.**

i. මෙම පද්‍ය පන්තිය කිනම් අයෙකුගේ මුවින් කියැවෙන්නක් ද?

..........................................................................................................

ii. මෙහි ‘ඔබ’ යනු කවරෙකු විය හැකි ද?

..........................................................................................................

iii. කවියා පවසන පරිදි දෑසේ නිල් පැහැය දැවී, දිය වී, සේදී ගියේ කිනම් හේතු නිසා ද?

අ. දැවී - ..............................................

ආ. දිය වී - ..............................................

ඇ. සේදී - ..............................................

iv. නිල් පැහැය රැඳි ස්ථාන තුනක් කවියා දක්වයි. ඒ මොනවා ද?

අ. ...............................................................

ආ. ...............................................................

ඇ. ...............................................................

v. 'අනාගතය දෙස යොමු වූ' යන්නෙන් කිනම් අරුතක් කියැවේ ද?

....................................................................................................

**4. පහත පදවල අර්ථයට සමානාර්ථවත් පද පද්‍ය පන්තියෙන් උපුටා දක්වන්න.**

i. හසරැලි - ..........................................  ii. කර්ණ - ..........................................

iii. ගින්දර - ..........................................  iv. වර්ණය - ..........................................

v. දේව - ..........................................  vi. යෞවන - ..........................................

vii. භෝජන - ..........................................  viii. පිසෙන - ..........................................

ix. හදවත - ..........................................  x. දෙනෙත - ..........................................

**5. පහත කවි පදවල අර්ථය දී ඇති පිළිතුරු අතුරෙන් තෝරන්න. නියමිත අක්ෂරය වරහනේ ලියන්න.**

i. සිනා හඬට කන් දී ගෙන ( )  අ) බත ඉදෙන හඬට කන් යොමු කර

ii. හද මිරිකා හළ කඳුළට ( )  ආ) ජීවිතය ගත වන කල්හි

iii. හිරු අවරින් නැව් නැඟි පසු ( )  ඇ) හදවතේ නැගෙන දුක කඳුළු බවට පත් වීම

iv. දිවි ගණනක් ගෙවෙනා විට ( )  ඈ) සුළු මුදලක් උපයා ගැනීමට

v. තනිව හඬන ලොවක් සමග ( )  ඉ) ඉතා මිහිරි රසයක් ලැබීම

vi. බත් දෙකටක් උපයන්නට ( )  ඊ) හිරු බැස ගිය පසු

vii. දෙව් බොජුනක රස මැවෙන්න ( )  උ) හුදකලාව අඳුර සමග තනි වීම

ඌ) අඳුරෙහි පෙර මග බලා සිටීම

# විශේෂණ පද

**01. පහත දී ඇති අංකිත පද අයත් වන විශේෂණ පද වර්ගය දක්වන්න.**

- **නාම විශේෂණ නම් 'නා' යන්න ද**
- ක්‍රියා විශේෂණ නම් 'ක්‍රි' යන්න ද වරහනේ දක්වන්න.

1. සිනා හඬ - (   )
2. ළිප ගිනි - (   )
3. සෙමෙන් තුරන් විය - (   )
4. ඉදෙන බතේ - (   )
5. සෙමෙන් අඳුරට දිය විය - (   )
6. මුදු සැනසිල්ලක් - (   )
7. නිල් පැහැය - (   )
8. දෙව් බොජුනක - (   )
9. ඉක්මනින් පැතිරෙයි - (   )
10. කරුණාවෙන් සලකමු - (   )

**02. පහත දැක්වෙන වාක්‍ය සඳහා නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද යොදා ලියන්න.**

i. ක්‍රීඩකයා දුවයි.

......................................................................................................................................

ii. ගොවියා කුඹුර කොටයි.

......................................................................................................................................

iii. ගුරුවරයා ශිෂ්‍යයා දිරිමත් කරයි.

......................................................................................................................................

iv. රියැදුරා රිය පදවයි.

......................................................................................................................................

v. ළමයා සෙල්ලම් කරයි.

......................................................................................................................................

## කවියක රස විඳ නව කවි පබඳිමු

## 01. පිළිතුරු ලියන්න.

1. රාමායණය රචනා කළේ කවරෙකු විසින් ද?

.............................................................................................................................................

2. එයට ආරාධනා කළේ කවරෙකු ද?

.............................................................................................................................................

3. ඊට ඇතුළත් වූ කතා පුවත කුමක් ද?

.............................................................................................................................................

4. කාව්‍ය නිර්මාණ සඳහා අත්දැකීම් ලබා ගත හැකි ආකාර තුනක් දක්වන්න.

.............................................................................................................................................

5. 'ඇසේ මතුවන කඳුළු බිඳු ගෙන'' ගීතය කාගේ නිර්මාණයක් ද?

.............................................................................................................................................

6. බ්‍රෝ වාර්තාවේ දැකිය නොහැකි, මහගම සේකරගේ කවියේ දැකිය හැකි ලක්ෂණ මොනවා ද?

.............................................................................................................................................

7. මහගම සේකරගේ ඇසේ මතුවන ... ගීතය හා බ්‍රෝහියර්ගේ වාර්තාවේ වන සමානතාව කුමක් ද?

.............................................................................................................................................

8. ''ඇසේ මතුවන ගීතය'' රසවත් වීමට හේතු වූ කරුණු මොනවා ද?

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

## 02.

i. කැමති මාතෘකාවක් යොදා ගෙන පන්තියේ සියලු දෙනා පද්‍ය පන්තිය බැගින් නිර්මාණය කර පොතක් සකස් කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

ii. එම පද්‍ය පන්තිය රස විඳිමින් විචාරය කරන්න. රසවත් තැන් අගයන්න. අඩුපාඩු සකස් කරන්න.

iii. මාතෘකා තෝරා ගෙන විවිධ කවි නිර්මාණය කරන්න.

# පිළිතුරු

## දෑසේ නිල් පැහැය

1.
i. (√) ii. (√) iii. (x) iv. (√) v. (√) vi. (√) vii. (√) viii. (x)

2. i. උපතින් ii. භාවිතය iii. දිව්‍ය iv. නිල් මහනෙල්
v. උපත vi. බටහිරින් vii.ගැඹුරු මුහුද

3. i. බිරිඳකගේ ii. ස්වාමියා

iii. (අ). ළිපට පිඹීම (ආ). රැයෙහි මග බලා සිටීම (ඇ). හද තුළ වේදනා ඇති වීම

iv. (අ) නිල් ඉඳුවර (ආ). ඈත දියඹ (ඇ) යොවුන් වියේ දෑස

v. දියණියගේ අනාගතය යහපත් කිරීමට / අනාගතය දෙස බලා සිටින / අනාගත ජීවිතය ගැන සිතීම

4. i. සිනා ii. කන iii. ගිනි iv. පැහැය v. දෙව්

vi. යොවුන් vii. බොජුන viii. ඉදෙන ix. හද x. දෑස

5. i. (අ) ii. (ඇ) iii. (ඊ) iv. (ආ) v. (උ)

vi. (ඈ) vii. (ඉ)

## විශේෂණ පද

01. 1. නා 2. නා 3. ක්‍රි 4. නා 5.ක්‍රි

6. නා 7. නා 8. නා 9. ක්‍රි 10. ක්‍රි

02. දක්ෂ, ප්‍රවීණ, ධෛර්යවන්ත, විනීත, කුඩා වැනි පද / වේගයෙන්, සතුටින්, හොඳින්, පරිස්සමෙන්, ආසාවෙන්, උද්දාමයෙන් වැනි පද

## කවියක රස විඳ නව කවි පබඳිමු

01. 1. වාල්මිකී ඍෂිවරයා 2. මහා බ්‍රහ්මයා 3. රාම කුමරුගේ ජීවිත කතාව

4. තමන් ලබන, හද සසල කරන අත්දැකීම්, පොත්පත් පුවත්පත් කියවීමෙන් ලද අත්දැකීම්
වෙනත් කෙනෙකු කියනු ඇසුවක් පදනම් වූ අත්දැකීම්

5. මහගම සේකර

6. ඍජු වර්ණනාවක් නොවේ, භක්ති පූර්වක හැඟීම් සපිරුණු නිර්මාණයක් වීම, භාෂාව
රූපකාර්ථවත් ය, සුන්දර බව, විචිත්‍ර බව, සුගායනීය බව

7. අවුකන පිළිමය තේමාව කර ගැනීම

8. අපූරු ශබ්ද රසයකින් යුතු වීම, අසන විට භක්ති පූර්ව හැඟීම් දැනවීම, චිත්‍ර රූප මැවෙන භාෂාවක් යෙදීම, යොදාගත් භාෂාවේ සරල බව මෙන්ම ව්‍යංග්‍යාර්ථවත් බව, නැවත නැවත අසා රසවිඳීමට පෙළඹීම.